**ගැයූ ගී සරණ යාම හැරුණු විට රටට දැනෙන තමන්ගේ ලකුණක් තියන්නට තරම් ප්‍රඥාවක් ඔවුන් වර්ධනය කරගන්නා බවක් ගෙවුණු වසර හත අට තුළම දැකගත නොහැකි විය. විද්‍යුත් මාධ්‍ය සන්දර්ශන මැද කරළියට එන මෙම තරු, සලකුණක් නොතියාම සැඟවී යනුයේ මුල් නැති පරපුරක කේදවාචකය අපට පසක් කොට දෙමිනි.** ගුවන් විදුලි නාලිකා හතලිහකටත් අධිකව පවතින වටපිටාවක මෙම තරුවලට



තම අනන්‍යතාවක් මත පැවතිය නොහැකිව තිබෙන්නේ මෙම නොමේරූ සංගීත භාවිතාව නිසා බව මගේ හැඟීමයි. එහෙත් එදවස පැවති එකම ගුවන් විදුලිය තුළින් වනස්පති බඳු ශිල්පීන් බිහිවිය.

අද ද මේ සුපිරි තරු ඇවිද යනුයේ ඔවුන් ඉතිරි කළ තරු ලකුණු දිගේය. එහෙත් එම තරු එළිය දූෂණය කිරීමට සුපිරි තරු පරපුරට අයිතියක් නැත. ඔවුන් කළ යුත්තේ තම කුසලතා මතින් නැගී සිටීමයි. . එහෙත් එවැනි දැනුවත් ගමනකට මෙම පිරිස සැරසෙන බවක්නම් නම් දැකගත නොහැකි ය.

ගේය පද රචනයකට ගැඹුරින් සමවැදිය හැකි සාහිත්‍ය ඥානයක් ගායන ශිල්පියා සතු විය යුතුය. අපගේ සංගීත ක්ෂේත්‍රය තුළද එවැනි ශිල්පීන් ඇත්තේ අතලොස්සක් පමණි. ගීත කිහිපයක් ගායනා කළ පමණින් හිස උදුමවා ගැනීම ශිල්පියකුට තරම් නොවේ. **ස්වර අභ්‍යාස කිරීම මෙන්ම විවිධ පොත පත පරිශීලනය උසස් ශිල්පියෙකුගේ දින චර්යාව විය යුතුය. අද්‍යතන සුපිරි තරු පරපුර තුළ අපට අපට දැක ගත නොහැක්කේද මෙම ශිල්පීය ශික්ෂණය හා සමාජ දැක්මයි.** මෙම මහඟු පාඩම සුපිරි තරු විකුණන මාධ්‍ය වෙළෙන්දන් වෙතින් උගත නොහැක්කකි. ඔවුන් වෙතින් උගත හැක්කේ විකුණන්නේ හා විකිනෙන්නේ කෙසේද යන්න ගැන පමණි. සුරේන්ද්‍ර ජෝතිපාල ගැයූ ගී තම හඬින් විකුණන්නේ ඔහු මෙම අශික්ෂිත හා අසංස්කෘතික ක්‍රමයේ නිශ්පාදියක් බැවිනි.

ravi.siriwardhana@gmail.com

Sannasa Online
www.sannasa.com
www.sannasa.net

*පසු කරමින් මහ කඳු වැටි ඕවිටි*
*පාලු සොහොන් පිටි රබර් වතු බඩ වැටි*
*ගල් මුල් වල පහ පැටලී වැටි වැටි*

සිංහල භාෂා විශාරදයකු වන වි ක ධර්මබන්ධු මහතා සන්නස ආරම්භයේ සිටම අපේ පාඨකයනට නිවැරදි සිංහලය කුමක්දැයි හඳුන්වා දෙන්නට අනලස්ව ලිපි ලියන විද්වතෙකි. ගුරු සීයා සහ විකසිත යන අන්වර්ථ නාම වලින්ද ඔහු වරින් වර අපට ලියයි.

ධර්මබන්ධු මහතාත් එම මැතිනියත් සිය විවාහ ජීවිතයේ 50 වන සැතපුම් කනුව පසුගිය දා පසු කළ හ. ඒ සුබ කාරණය අපේ පාඨකයන් හා බෙදා ගන්නේ ධර්මබන්ධු මහතාටත් එම මැතිනියටත් සුබ පතමින් ය.






